සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 07 - 2023

## ඉතිහාසය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I - කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරුවලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) කාලිංග මාඝගේ ආක්‍රමණය එල්ල වූ අවධියේ පොළොන්නරුවේ පාලකයා ලෙස කටයුතු කළේ,

1. නිශ්ශංකමල්ල රජුය. 2. පරාක්‍රමබාහු රජු ය.
3. පරාක්‍රම පාණ්ඩ්‍ය රජු ය. 4. පස්වන මිහිඳු රජු ය.

02) පහත සඳහන් ස්ථාන අතරින් තුන්වන විජයබාහු රජතුමා විසින් ඉදිකරවන ලද දළදා මාළිගය පිහිටි ස්ථානය කුමක් ද?

1. බෙලිගල 2. මහනුවර 3. පොළොන්නරුව 4. යාපහුව

03) ශ්‍රී ලංකාවේ, වෙස්මුහුණු හා රූකඩ කලාව සඳහා ප්‍රසිද්ධ ව ඇත්තේ,

1. උඩුපිල ප්‍රදේශය යි. 2. ගම්පොළ ප්‍රදේශය යි.
3. දුම්බර ප්‍රදේශය යි 4. පිළිමතලාව ප්‍රදේශය යි.

04) ඉතාලියේ අගනගරය බවට පත් නගරය කුමක් ද?

1. ග්‍රීසිය 2. රෝමය 3. ජෙරුසෙලම 4. ඇතැන්ස්

05) 'කහාපණ' නම් කාසි වර්ගය නිපදවා ඇත්තේ,

1. රිදී වලිනි. 2. රත්තරන් වලිනි. 3. තඹ වලිනි. 4. ලෝකඩ වලිනි.

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06) ජන ගී හා සිරිත් විරිත් අස්පෘශ්‍ය උරුමවලට අයත් වේ. ( )

07) සුභ සෙනෙවියා විසින් මිනිපේ ගංදෙණිය පර්වතය මුදුනේ ආරක්ෂිත බලකොටුවක් ඉදි කරවන ලදි. ( )

08) විජය කුලංගෛ ආර්යචක්‍රවර්තී යාපන රාජධානියේ ආරම්භක පාලකයා වේ. ( )

09) පාතිනන් දෙවිමැඳුර රෝමයේ පිහිටි පැරණි ගොඩනැගිල්ල කි. ( )

10) ඔක්ටේවියස් හෙවත් ඔගස්ටස් සීසර් පළමුවන රෝම අධිරාජයා ලෙස සළකණු ලැබේ. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

11) සිංහල, පාලි, සංස්කෘත වැනි භාෂා හැදෑරූ විශිෂ්ට උගතෙකු වූ නිසා ....................................... රජතුමා කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් හඳුන්වන ලදි

12) ගම්පොළ යුගයේ දී ..........................................ජාතිකයෙකු වූ ඉබන් බතූතා ලංකාවට පැමිණ ඇත.

13) පැරණි ග්‍රීක ශිෂ්ටාචාරයේ වැසියන් ........................ දෙවියා දේව පරපුරේ ප්‍රධානියා ලෙස සළකනු ලැබේ.

14) නිශ්ශංකමල්ල රජතුමා විසින් පොළොන්නරුවේ ඉදිකරන ලද දළදා මැදුර........................................ නමින් හැඳින්වේ.

15) පළමුවන පැරකුම් රජුගේ බිරිඳ වූ.............................. බිසව නැටුම් ගැයුම් සඳහා දක්ෂතාවයක් දැක් වූ කාන්තාවක බව මහාවංසයේ දැක්වේ.

( හැටදාගෙය / දෙවන පැරකුම් රජතුමා / සියුස් / රූපවතී / අරාබි / රෝම / සුගලා / ලංකාතිලකය )

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර කුමක්දැයි ලියා දක්වන්න.**

16) රුහුණේ සිටි ජන ප්‍රධානියෙකු වූ බුදල්නාවන් වෙත ලබා දුන් වරප්‍රසාද රැසක් පිළිබඳ තොරතුරු ............................................ සන්නසේ සඳහන් වේ.

17) දෙවන පැරකුම් රජතුමා ...........................................................නම් ඇමතිවරයා යොදවා රටේ සංවර්ධන කටයුතු රැසක් සිදුකරවන ලදී.

18) පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්ථනය කරවීම.............................................. යුගයේ දී සිදු වූ වැදගත් සිදුවීමකි.

19) රෝමයේ ඉදිකර ඇති ..............................................නම් මහා නාන තටාකය ලෝක ඉතිහාසයේ වැදගත් ස්මාරකයකි.

20) වගා කටයුතු සඳහා අලුතෙන් ගිනි තබා සකස් කරගත් බිම් කොටස අතීතයේ දී..................…නමින් හඳුන්වා ඇත.

## II - කොටස


- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.




01)

(අ) i. ශ්‍රී ලංකාවේ පස්වන රාජධානිය වූ A අක්ෂරයෙන් දැක්වේ. එම නගරය හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 2)

ii. යාපනය රාජධානිය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද? (ලකුණු 2)




(ආ) i. රෝම ශිෂ්ටාචාරය බිහිවූ රට ලෝක සිතියමේ A අක්ෂරයෙන් දැක්වේ. එම රට හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 2)

ii. ශ්‍රී ලංකාව අතීතයේ සිට වෙළෙඳ සබඳතා පැවැත්වූ චීනය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක්ද? (ලකුණු 2)



A


(ඇ) i. A ඡායාරූපයෙන් දැක්වෙන විහාරස්ථානය කුමක් ද?

ii. එය ඉදිවූයේ කිනම් රාජධානි සමයකදී ද?

iii. එම රාජධානියේ ආරම්භක පාලකයා කවුරුන් ද?

iv. මෙම රාජධානියට සමකාලීනව පැවති රයිගම රාජ්‍යයේ පාලන කටයුතු මෙහෙය වූ ප්‍රභූ පරපුර කුමක් ද?

(ලකුණු 4)



B

(ඈ) i. B ඡායාරූපයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?

ii. එය කවුරුන් උදෙසා ඉදිවූවක් ද?

iii. එය පිහිටි රට කුමක් ද?

iv. එය ඉදිකිරීම සඳහා බහුලව යොදාගත් අමුද්‍රව්‍යයක් නම් කරන්න.

(ලකුණු 4)

02)

i. අතීතයේ හේන්වල වගා කරන ලද ඇල් වී වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 3)

ii. ලංකාවේ කර්මාන්ත සම්බන්ධයෙන් ඔබ උගත් කරුණු ඇසුරෙන් වගුවේ ඉංග්‍රීසි අක්ෂරවලට ගැලපෙන වචනය වරහන් තුළින් තෝරන්න. A,B,C හා D ඉංග්‍රීසි අක්ෂර ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා ඔබ තේරූ නිවැරදි පිළිතුර ඊට ඉදිරියෙන් ලියන්න.

| කර්මාන්තය | ශිල්පීන් | නිෂ්පාදිත භාණ්ඩ |
|---|---|---|
| මැටි | **A**.................................... | **B**.................................... |
| **C**.............................. | පෙහෙකාර | **D**.................................... |

( වළං / රෙදි පිළි / ලෝකුරු / පලිහ / කපු / කුම්බකාර / සීනි ) (ලකුණු 4)

iii. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. පැරණි මූලාශ්‍රයවල නිගම ලෙස හඳුන්වා ඇත්තේ කුමක් ද?

B. ත්‍රිකුණාමල වරාය අතීතයේ හඳුන්වා ඇති නම කුමක් ද?

C. අතීත මිනිසුන් ශ්‍රමයට ශ්‍රමය හුවමාරු කරගත් ක්‍රමය හඳුන්වන නම කුමක් ද?

D. සාලිය කුමරුගේ බිසව කවුරුන් ද? (ලකුණු 4)

03)

i. අනුරාධපුර යුගයේ දී ලංකාව කෙරෙහි සෘජු බලපෑම් එල්ල කළ පහත සඳහන් දකුණු ඉන්දියානු රාජධානිවල අගනගර නම් කරන්න.

A - පල්ලව

B - පාණ්ඩ්‍ය

C - චෝල (ලකුණු 3)

ii. පළමුවන විජයබාහු රජතුමා සම්බන්ධ තොරතුරු ඇසුරෙන් A,B,C හා D ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| පළමුවන විජයබාහු රජතුමාගේ | A - මව කවුරුන් ද? ................................................ |
| | B - පියා කවුරුන් ද? ................................................ |
| | C - සහෝදරිය කවුරුන් ද? ...................................... |
| | D - අග බිසව කවුරුන් ද? ...................................... |

(ලකුණු 4)

iii. නිශ්ශංකමල්ල රජු පොළොන්නරුවේ රජකමට පත් වීමේ දී මුහුණ දුන් අභියෝග හතරක් නම් කරන්න.

(ලකුණු 4)

04)

i. දෙවන පැරකුම් රජතුමාට මුහුණ දීමට සිදු වූ සතුරු ආක්‍රමණ තුන නම් කරන්න. (ලකුණු 3)

ii. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. කුරුණෑගල රාජධානියේ ආරම්භක පාලකයා නම් කරන්න.

B. එතුමාගෙන් පසු කුරුණෑගල රජ බවට පත් වූ පාලකයා කවුරුන් ද?

C. කුරුණෑගල යුගයේ දී රචනා වූ කෘති දෙකක් නම් කරන්න. (ලකුණු 4)

iii. A. කෝට්ටේ යුගයේ දී ආරම්භ වූ පිරිවෙන් දෙකක් නම් කරන්න.
B. යාපන රාජධානියේ ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් වන ග්‍රන්ථ දෙකක් නම් කරන්න. (ලකුණු 4)

05)

i. පැරණි ග්‍රීක ශිෂ්ටාචාරයට අයත් නගර තුනක් නම් කරන්න. (ලකුණු 3)

ii. ග්‍රීක ශිෂ්ටාචාරය බිහිවූ ග්‍රීසියේ පිහිටීම සම්බන්ධ පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

A. ග්‍රීසියට නැගෙනහිරින් පිහිටි මුහුද කුමක් ද?

B. ග්‍රීසියට බටහිරින් පිහිටි මුහුද කුමක් ද?

C. ග්‍රීසියට උතුරින් පිහිටි රට කුමක් ද?

D. ග්‍රීසියට අයත් විශාලතම ම දූපත කුමක් ද? (ලකුණු 4)

iii. ග්‍රීසියේ සිටි,

A- ප්‍රසිද්ධ නාට්‍යකරුවන් දෙදෙනෙකු ගේ නම් ලියන්න.
B- විශිෂ්ට ඉතිහාසකරුවන් දෙදෙනෙකු නම් කරන්න. ( ලකුණු 4)

06)

i. පැරණි රෝම අධිරාජ්‍යයට අයත්ව තිබුනා යැයි ඔබ ඉගෙනගත් රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 3)

ii. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. පැරණි ජනප්‍රවාදවලට අනුව රෝමය ඉදිකරවන ලද්දේ කවුරුන් විසින් ද?
B. ජෙරුසෙලම රෝම අධිරාජ්‍යට අයත්ව පැවති අවධියේ දී එහි සිදු වූ වැදගත් සිදුවීම කුමක් ද?
C. රෝමයේ විසූ වර්ජිල් නම් කතුවරයා විසින් රචිත පද්‍ය ග්‍රන්ථය නම් කරන්න.
D. රෝම සමාජය බෙදී තිබූ කොටස් තුනෙන් පහලම සමාජ කණ්ඩායම කුමක් ද? (ලකුණු 4)

iii. රෝම ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දායාදයන් හතරක් නම් කරන්න. (ලකුණු 4)

07)

i. අතීත ශ්‍රී ලංකාවේ පැවති කෘෂිකාර්මික කටයුතු බෙදී තිබූ ආකාරයට අනුව පහත දෙබෙදුම් සටහන සම්පූර්ණ කරන්න.

කෘෂිකර්මාන්තය

- ගොවිතැන
  - B.............................
  - C.............................
- A.............................

(ලකුණු 3)

ii. පහත වගුවේ ඡායාරූප ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
|  | 1. මෙම දාගැබ හඳුන්වන නම ලියන්න<br>2. මෙම ස්ථානයේ උපත ලැබූ රජතුමා කවුරුන් ද?<br>3. එම රජතුමාගේ මව ගේ නම කුමක් ද? |
|  | 4. ඡායාරූපයේ දැක්වෙන නිර්මාණය හඳුන්වන නම කුමක් ද?<br>5. එය කුමන රාජධානි සමයක ඉදි වූවක් ද?<br>6. එය අපේ රටේ ස්පෘශ්‍ය උරුමයක් ද නැතිනම් අස්පෘශ්‍ය උරුමයක්ද යන්න හඳුනාගෙන නම් කරන්න. |
|  | 7. මෙම පින්තූරයෙන් දැක්වෙන චිත්‍ර කලාව ආශ්‍රිත කර්මාන්තය කුමක් ද?<br>8. මෙම සිතුවම් ඇඳීම ට යොදාගනු ලබන අමුද්‍රව්‍ය සකස්කර ගැනීම සඳහා අවශ්‍ය කරන ජීවීන් වාසය කරන ශාකයක් නම් කරන්න |

(ලකුණු 8)